Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## දෙඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

### තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම

දෙඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01. | මුරකරු | 01 | PL -1 2016 | රා.ප.ච.3/2016 අනුව රු.24,250-250x10-270x10-300x10-330x12- රු. 36,410<br>III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | *අධ්‍යාපන සුදුසුකම් :*<br>අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයන් හයක් (06) සමත් විය යුතුය. (මින් විෂයන් පහක් (05) එකවර සමත්විය යුතුය).<br>*කායික සුදුසුකම් :*<br>තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවය. |
| 02. | බරයන්ත්‍රෝපකරණ ක්‍රියාකරු | 01 | PL- 3 2016 | රා.ප.ච.3/2016 අනුව රු.25,790-270x10-300x10-330x10-350x12- රු. 38,990<br>iv වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | *අධ්‍යාපන සුදුසුකම් :*<br>අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයන් හයක් (06) සමත් වී තිබීම. (මින් විෂයන් පහක් (05) එකවර සමත්විය යුතුය). |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 02 | | | | | *වෘත්තීය සුදුසුකම් :*<br><br>1. බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොන්ඩර් 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් හා මගීන් 32 ට වඩා ගෙන යා හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුනතාවය පිළිබඳ සහතිකයක් හෝ "ඒ" පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "ඩී" පන්තියේ බලපත්‍රයක්) ලබා තිබිය යුතුය.<br><br>2. අවම උස අඩි 05 ක් විය යුතුය.<br><br>3. බර යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳව තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද NVQ 04 මට්ටම අදළ සහතික පතක් තිබිය යුතුය.<br><br>4. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතුය.<br><br>**පළපුරුද්ද - සීමිත බඳවා ගැනීම :**<br><br>පළාත් පාලන ආයතනයක PLI/PL2 තනතුරක ස්ථිර කර තිබීම.<br>හා එම තනතුරක සේවා කාලය වසර තුනක් සම්පූර්ණ කර තිබීම.<br>බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවීම පිළිබඳව මාස 06 ක පළපුරුද්ද ලබා තිබීම.<br><br>**පළපුරුද්ද - විවෘත බඳවා ගැනීම :**<br><br>බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවීම පිළිබඳව වසරක පළපුරුද්ද ලබා තිබීම.<br><br>**කායික සුදුසුකම් :**<br><br>සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමානය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 03 | සෞඛ්‍ය කම්කරු | 02 | PL 1 2016 | රා.ප.ච.3/2016 අනුව රු.24,250-250x10-270x10-300x10-330x12- රු. 36,410<br>III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබිය යුතු ය.<br><br>කායික සුදුසුකම් :-<br><br>තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. |

03. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

I. අයදුම්පත්‍ර බාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන අයට උපරිම හෝ අවම වයස් සීමාව බල නොපැවැත්වේ)

II. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

අයදුම් පත් කැඳවන දිනට පූර්වාසන්න වසර තුනක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි.

III. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට මෙම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

IV. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

V. සාපරාදී වරදක් යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය* :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් ලකුණු ලබා දීමේ ක්‍රමය:

**මුරකරු**

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ දී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

**බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු,**

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| මාර්ග නීති පිළිබඳ දැනුම් පරීක්ෂා කිරීම | 30 | 50% |
| යාන්ත්‍රික ක්‍රියාකාරිත්වය හා එහි පැවැත්ම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම | 50 | |
| ප්‍රායෝගික පරීක්ෂණය | 15 | |
| පෞරුෂත්වය | 05 | |

සෞඛ්‍ය කම්කරු

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂය | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාලව ලබා ඇති පලපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

I. මෙම තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.
II. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ද දායක විය යුතුය.
III. පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වන්නේය.
IV. මෙම බඳවා ගැනීම් ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලට ද රජය හෝ බස්නාහිර පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලට යටත් වේ.

05. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

අයදුම්කරුවන් විසින් පහත සඳහන් ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කර ගත් අයදුම්පත පහත සඳහන් ලිපි ලේඛන වල පිටපත් සමග 2017.10.03 දිනට පෙර ලැබෙන සේ ලේකම්, දෙඩන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ ඉහල "තනතුරු පුරප්පාඩු සඳහා අයදුම් කිරීම" ලෙස සටහන් කල යුතු අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- උප්පැන්න සහතිකය,
- ජාතික හැඳුනුම්පත,
- අධ්‍යාපන සහතික,
- පදිංචිය සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් අනු අත්සන සහිත ග්‍රාම නිලධාරී සහතිකය,
- මෑතකදී ලබා ගන්නා ලද චරිත සහතික 02 ක්,
  (එක් චරිත සහතිකයක් ප්‍රාදේශීය ලෙකම් අනු අත්සන සහිත ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මහතාගෙන් ලබා ගත යුතුය.)
- වෘත්තීය පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් දක්වෙන සහතික.

06. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල දෙඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

පී. ජී. පී රුද්‍රිගෝ,
ලේකම්,
දෙඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

2017 අගෝස්තු මස 29 වැනි දින,
දෙඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ දී ය.

## ආදර්ශ අයදුම් පත්‍රය

*බස්නාහිර පළාතේ රාජ්‍ය සේවයේ දෙඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ..........................තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. මුලකුරු සමඟ නම :———————————— .
02. මුලකුරු වලින් හැඳින්වෙන නම් :———————————— .
03. ස්ථිර ලිපිනය:———————————— .
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:———————————— .
05. ජාතික හැඳුනුම්පත් අංකය :———————————— .
06. දුරකථන අංකය :———————————— .
07. උපන් දිනය : වර්ෂය:—————— මාසය:—————— දිනය:——————

08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයසඃ අවුරුදු:—————— මාස:—————— දින:——————

09. විවාහක/අවිවාහක බව :———————————— .
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? යන වග :———————————— .

අධ්‍යාපන සුදුසුකම් ඃ

| | |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

වෙනත් සුදුසුකම් :———————————— .

11. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවකු නම් මෙම කොටස සම්පූර්ණ කරන්න :

    I. දැනට දරන තනතුර :———————————— .
    II. එම තනතුරට පත් වූ දිනය :———————————— .
    III. වර්තමාන සේවා ස්ථානය හා ලිපිනය :———————————— .

12. මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මීට පෙර මා රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවකු හෝ සේවය අතහැර ගිය අයකු හෝ සාපරාධී වරදක් සම්බන්ධයෙන් අධිකරණයක් මගින් වරදකරුවකු වී නොමැති අයකු බවත් මා ඉහත තනතුර සඳහා තෝරා පත් කර ගැනීමට පෙර හෝ පසුව ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට හෝ දඩුවම් ලැබීමට යටත් බවත් දනිමි.

————————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :———————————— .

(දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවකු නම්) දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා ලවා මෙම කොටස සම්පූර්ණ කරවා ගන්න.

ඉහත අයදුම්කරු වන ..............................................මහතා/මිය/මෙනවිය මෙම ආයතනයේ...................................... වශයෙන්......................................... දින සිට කටයුතු කරනු ලබයි. ඇයගේ/ඔහුගේ පත්වීම............................ දින සිට ස්ථිර කර ඇත. අයදුම්කරු මීර පෙර විනයානුකූල දඬුවම් ලබා ඇති/නැති අතර ඇයට/ ඔහුට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමක් මේ වන විට සිදු කරමින්/නොකරමින් නොපවතී. මෙම තනතුරට තෝරාපත් කරනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් මුදා හැරිය හැකිය/නොහැකිය. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

________________________

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / ආයතනික ප්‍රධානියාගේ අත්සන.

දිනය :________________________ .